# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2124/34 – 2019 මැයි 24 වැනි සිකුරාදා – 2019.05.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, කපුගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩීවීඑන්/ 2017/560 හා 2018.07.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් පහත නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

1. **කැබලි අක්ෂර 'ඒ' – ගෙදරවත්ත නොහොත් ගාල්ලෙගෙදරවත්ත, ජූල්ගහකොරටුව නොහොත් ජූල්ගහවත්ත, ඉහලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.8855**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: හිමිකම් කියන අය නොදන්නා ඉහලහේනවත්ත, හිමිකම් කියන අය නොදන්නා නුගගහහේන සහ විමලසේන අලහකෝන් හිමිකම් කියන වතුපිටවත්ත; දකුණට: හිමිකම් කියන අය නොදන්නා ඉහලහේනවත්ත, හිමිකම් කියන අය නොදන්නා නුගගහහේන, විමලසේන අලහකෝන් හිමිකම් කියන වතුපිටවත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/වීර්/118.
2019 මාර්තු මස 12 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

06 – 162

---

සංශෝධනයයි

2019.04.08 දින පළකරන ලද අංක 2118/6 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ 04 - 721 යටතේ පළ වූ නිවේදනයේ දෙවැනි ඡේදයේ මුද්‍රණ දෝෂයකින් ''වීරකුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා වීරකුඹුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය'' යනුවෙන් වැරදි ලෙස පළ වී ඇත. එය,

''වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා වීරඹුගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාසය'' ලෙස නිවැරදි විය යුතුය.

ප්‍රාදේශීය ලේකම්,
වීරඹුගෙදර.

2019 මැයි මස 23 වැනි දින.

06 – 163